රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 04/96

මගේ අංකය :- II-572ඊ 2 ඩීජ්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, වැවිලි
කර්මාන්ත හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.
1996.02.01

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ රාජ්‍ය සංස්ථා
ප්‍රධානීන් වෙත.

# විදුලි බලය ඉතිරි කිරීම

විදුලිබලය සංරක්ෂණය කිරීමෙහිලා රජයේ දෙපාර්තමේන්තු හා සංස්ථාවල සහයෝගය ලබා දෙන ලෙස මෙම අමාත්‍යාංශයෙන් ඉල්ලා ඇත.

02. මෙම වර්ෂයේ මුල් භාගයේදී ලැබිය යුතු වර්ෂාපතනය, ජලාශ ඇති ප්‍රදේශවලට නොලැබීම නිසා, ජල විදුලිබලය නිෂ්පාදන කිරීම සීමා කිරීමට සිදු වී ඇති බැව් විදුලිබල මණ්ඩලය දන්වා ඇත.

03. විදුලිබලය ඉතිරි කිරීම ගැන වගකිව හැකි නිලධාරියෙකු / නිලධාරීන් තම තමන්ගේ කාර්යාලවල / උප කාර්යාලවල පත් කරන මෙන් ඔබ සැමගෙන්ම ඉතා කාරුණිකව ඉල්ලුම් කරමි. එවැනි නිලධාරියෙකු / නිලධාරීන් නම් වශයෙන් හෝ නිල නාම වශයෙන් නිශ්චිතව හැඳින්විය යුතු අතර, එදිනෙද වැඩ කටයුතු අවසනායේදී විදුලි පහන්, විදුලි පංකා, වායු සමීකරණ ආදී යන්ත්‍ර නිවීම පමණක් නොව, දිවා කාලය තුළත් අනවශ්‍ය ලෙස ක්‍රියා කෙරෙන විදුලි පහන්, විදුලි පංකා, වායු – සමීකරණ යන්ත්‍ර ආදිය නිවීමේ කටයුත්ත ද පිළිබඳව වගකීම භාර ගන්නා ලෙස ඔහුගෙන් / ඔවුන්ගෙන් ඉල්ලුම් කර සිටිය යුතුය.

04. දැඩි විදුලිබල හිඟයක් පවත්නා මේ අවස්ථාවේදී,වායු සමීකරණ යන්ත්‍ර සහිත කාමරවල සේවය කරන නිලධාරීන් එම යන්ත්‍ර ක්‍රියා කරවීමෙන් වැළකෙන ලෙස විශේෂයෙන් ඉල්ලුම් කර සිටිමි. විදුලි සැපයුම හොඳ අතට හැරෙන තෙක්, විදුලි පරිභෝජනය අවම වශයෙන් 20% වත් අඩු කර ගැනීම අත්‍යාවශ්‍ය නිසා ඔබ කාර්යාලයේ විදුලි බල පරිභෝජනයද අවම වශයෙන් 20% වත් අඩු කිරීමට කටයුතු කරන මෙන් කාරුණිකව ඉල්ලමි.

අ.කලේ/(ආර්.එස්.ජයරත්න)
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, වැවිලි කර්මාන්ත
හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය